**දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදල - 2016**

**-----------------------------------------------------------**

දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ 2016 දෙසැම්බර් 31 දිනට මූල්‍ය තත්ත්ව ප්‍රකාශනය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය කාර්යසාධන ප්‍රකාශනය, ස්කන්ධය වෙනස්වීමේ ප්‍රකාශනය සහ මුදල් ප්‍රවාහ ප්‍රකාශනය හා වැදගත් ගිණුම්කරණ ප්‍රතිපත්ති සහ අනෙකුත් පැහැදිලි කිරීමේ තොරතුරුවල සාරාංශයකින් සමන්විත 2016 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා වූ මූල්‍ය ප්‍රකාශන 2013 අංක 1 දරන දිවි නැගුම පනතේ 45 වගන්තිය සමඟ සංයෝජිතව කියවිය යුතු ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 154 (3) ව්‍යවස්ථාවේ ඇතුළත් විධිවිධාන ප්‍රකාර මාගේ විධානය යටතේ විගණනය කරන ලදී. යථෝක්ත මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මාගේ අදහස් දැක්වීම් හා නිරීක්ෂණයන් මෙම වාර්තාවේ දැක්වේ.

## 1.2 මූල්‍ය ප්‍රකාශන සම්බන්ධයෙන් කළමනාකරණයේ වගකීම

**-----------------------------------------------------------**

මෙම මූල්‍ය ප්‍රකාශන ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව පිළියෙල කිරීම හා සාධාරණ ලෙස ඉදිරිපත් කිරීම සහ වංචා හෝ වැරදි හේතුවෙන් ඇති විය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවූ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට හැකි වනු පිණිස අවශ්‍යවන අභ්‍යන්තර පාලනය තීරණය කිරීම කළමනාකරණයේ වගකීම වේ.

## 1.3 විගණකගේ වගකීම

**-----------------------**

මාගේ විගණනය මත පදනම්ව මෙම මූල්‍ය ප්‍රකාශන පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීම මාගේ වගකීම වේ. මා විසින් උත්තරීතර විගණන ආයතනයන්ගේ ජාත්‍යන්තර විගණන ප්‍රමිතිවලට (ISSAI 1000 – 1810) අනුරූප ශ්‍රී ලංකා විගණන ප්‍රමිතිවලට අනුකූලව මාගේ විගණනය සිදුකරන ලදී. ආචාර ධර්මවල අවශ්‍යතාවන්ට මම අනුකූලවන බවට සහ මූල්‍ය ප්‍රකාශන ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් තොරවන්නේද යන්න පිළිබඳ සාධාරණ තහවුරුවක් ලබා ගැනීම පිණිස විගණනය සැලසුම්කර ක්‍රියාත්මක කරන බවට මෙම ප්‍රමිති අපේක්ෂා කරයි.

මූල්‍ය ප්‍රකාශනවල දැක්වෙන අගයන් සහ හෙළිදරව් කිරීම්වලට අදාළවන විගණන සාක්ෂි ලබා ගැනීම පිණිස පරිපාටි ක්‍රියාත්මක කිරීම විගණනයට ඇතුළත් වේ. තෝරාගත් පරිපාටීන්, වංචා හෝ වැරදි හේතුවෙන් මූල්‍ය ප්‍රකාශනවල ඇතිවිය හැකි ප්‍රමාණාත්මක සාවද්‍ය ප්‍රකාශනයන්ගෙන් අවදානම් තක්සේරු කිරීම් ද ඇතුළත් විගණකගේ විනිශ්චය මත පදනම් වේ. එම අවදානම් තක්සේරු කිරීම්වලදී, අවස්ථාවෝචිතව උචිත විගණන පරිපාටි සැලසුම් කිරීම පිණිස අරමුදලේ මූල්‍ය ප්‍රකාශන පිළියෙල කිරීමට සහ සාධාරණ ලෙස ඉදිරිපත් කිරීමට අදාළ වන්නාවූ අභ්‍යන්තර පාලනය විගණක සැළකිල්ලට ගන්නා නමුත් අරමුදලේ අභ්‍යන්තර පාලනයේ සඵලදායීත්වය පිළිබඳව මතයක් ප්‍රකාශ කිරීමට අදහස් නොකරයි. කළමනාකරණය විසින් අනුගමනය කරන ලද ගිණුම්කරණ ප්‍රතිපත්තිවල උචිතභාවය හා යොදාගන්නා ලද ගිණුම්කරණ ඇස්තමේන්තුවල සාධාරණත්වය ඇගයීම මෙන්ම මූල්‍ය ප්‍රකාශනවල සමස්ත ඉදිරිපත් කිරීම පිළිබඳ ඇගැයීමද විගණනයට ඇතුළත් වේ.

මාගේ විගණන මතය සඳහා පදනමක් සැපයීම උදෙසා මා විසින් ලබාගෙන ඇති විගණන සාක්ෂි ප්‍රමාණවත් සහ උචිත බව මාගේ විශ්වාසයයි.

## 1.4 තත්ත්වාගණනය කළ මතය සඳහා පදනම

**-------------------------------------------**

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණු මත පදනම්ව මාගේ මතය තත්ත්වාගණනය කරනු ලැබේ.

## 2. මූල්‍ය ප්‍රකාශන

### 2.1 තත්ත්වාගණනය කළ මතය

මෙම වාර්තාවේ 2.2 ඡේදයේ දක්වා ඇති කරුණුවලින් වන බලපෑම හැර, මූල්‍ය ප්‍රකාශනවලින් 2016 දෙසැම්බර් 31 දිනට දිවි නැගුම ක්ෂුද්‍ර මූල්‍ය ලිපිද්‍රව්‍ය චක්‍රීය අරමුදලේ මූල්‍ය තත්ත්වය සහ එදිනෙන් අවසන් වර්ෂය සඳහා එහි මූල්‍ය ක්‍රියාකාරීත්වය හා මුදල් ප්‍රවාහ ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිතිවලට අනුකූලව සත්‍ය හා සාධාරණ තත්ත්වයක් පිළිබිඹු කරන බව මා දරන්නා වූ මතය වේ.

### 2.2 මූල්‍ය ප්‍රකාශන පිළිබඳ අදහස් දැක්වීම

#### 2.2.1 ශ්‍රී ලංකා රාජ්‍ය අංශ ගිණුම්කරණ ප්‍රමිති

ප්‍රමිති අංක 02 ක ප්‍රකාරව මුදල් ප්‍රවාහ ප්‍රකාශනය සකස් කර නොතිබූ අතර ඒ සම්බන්ධයෙන් පහත කරුණු නිරීක්ෂණය විය.

(i) 2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාලවල ගබඩාවල තොග පොතේ ශේෂයට වඩා වැඩියෙන් පැවති භෞතික ශේෂයන්ගේ වටිනාකම රු. 121,788 ක් මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලා ඒමක් වශයෙන්ද, 2014, 2015 වර්ෂවල තොග හානි රු. 2,406,670 ක් සමාලෝචිත වර්ෂයේ ලාභයෙන් කපාහැරීම මෙහෙයුම් ක්‍රියාකාරකම් යටතේ මුදල් ගලායාමක් වශයෙන්ද, මුදල් ප්‍රවාහ ප්‍රකාශනයට ඇතුළත් කර තිබුණි.

(ii) සමාලෝචිත වර්ෂයේ ස්ථාවර තැන්පතු ආයෝජන පොලී ලැබීම් රු. 1,426,323 ක් වුවත් මුදල් ප්‍රවාහ ප්‍රකාශනයේ එය රු.1,550,351 ක් වශයෙන් ගෙන තිබුණි.

#### 2.2.2 ගිණුම්කරණ අඩුපාඩු

**පහත සඳහන් නිරීක්ෂණයන් කරනු ලැබේ.**

(අ) 2016 දෙසැම්බර් 31 දිනට රු. 14,000,633 ක් වූ ලිපිද්‍රව්‍ය තොග ගිණුමේ ශේෂයට වඩා වැඩියෙන් පැවති භෞතික තොග සමීක්ෂණ වාර්තාවේ ශේෂය රු. 17,648,683 ක් තොග ශේෂයට ගලපා තිබීම, තොග වටිනාකම රු. 410,067 ක් වූ තොගයක් තොග පොතට ඇතුළත්ව නොතිබීම හා කොස්වත්ත ගබඩාවේ පැවති රු. 994,585 ක් වටිනා ප්‍රයෝජනයට ගත නොහැකි තොගය අවසාන අත ඉතිරි භාණ්ඩ තොගයට ඇතුළත් කර තිබීම හේතුවෙන් තොග ශේෂයේ නිවැරදිතාවය පිළිබඳව සෑහීමකට පත්විය නොහැකි විය.

(ආ) දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගබඩාවල සමාලෝචිත වර්ෂයේ අවසානයට රු. 13,740,243 ක ඉතිරි තොගයට අදාළ නොයිපයූ ලාභ වෙන්කිරීම් රු. 1,249,123 ක් මූල්‍ය ප්‍රකාශනවලට ඇතුළත් කළ යුතු වුවද, බැංකු සංගම්වලට අලෙවි කළ ලිපිද්‍රව්‍ය ද ඇතුළත්ව දිස්ත්‍රික් කාර්යාලවලින් ලැබියයුතු රු. 29,559,575 ක මුළු මුදල සඳහා නොයිපයූ ලාභ වෙන්කිරීම් රු. 2,687,234 ක් වශයෙන් ගණනය කිරීම හේතුවෙන් රු.1,438,111 ක් වැඩියෙන් මූල්‍ය ප්‍රකාශනවල දක්වා තිබුණි. තවද, සමාලෝචිත වර්ෂයේදී නොයිපයූ ලාභ වෙන් කිරීම් ආරම්භක හා අවසන් ශේෂයන් නිවැරදිව නොගැලපීම නිසා උපලබ්ධි වූ ලාභයක් ලෙස රු. 408,901 ක් මූල්‍ය කාර්යසාධන ප්‍රකාශයට ගලපා තිබුණද, නිවැරදි තොගයට අදාල නොයිපයූ ලාභ වෙන් කිරීම් ගැලපීමෙන් උපලබ්ධි නොවූ අලාභය රු. 92,294 ක් වීම හේතුවෙන් ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ලාභය රු. 501,195 ක් වැඩියෙන් මූල්‍ය කාර්යය සාධන ප්‍රකාශනයේ දක්වා තිබුණි.

### 2.2.3 විගණනය සඳහා සාක්ෂි නොවීම

2016 දෙසැම්බර් 31 දිනට දිස්ත්‍රික් කාර්යාල දෙකක රු. 1,310,524 ක තොග ශේෂයන්ට අදාළ තොග සමීක්ෂණ වාර්තා විගණනයට ඉදිරිපත් නොවීය.

### 2.3 නීති, රීති, රෙගුලාසි හා කළමනාකරණ තීරණවලට අනුකූල නොවීම

පහත සඳහන් අනුකූල නොවීම් නිරීක්ෂණය විය.

| | නීති, රීති හා රෙගුලාසිවලට යොමුව | අනුකූල නොවීම |
|---|---|---|
| (අ) | ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ මුදල් රෙගුලාසි සංග්‍රහය මුදල් රෙගුලාසි 770 (2) | 2014 හා 2015 වර්ෂවලදී තොග සමීක්ෂණයෙන් පසු අපහරණය කරන ලද ප්‍රධාන තොග ගබඩාවේ පිරිවැය රු. 1,841,151 ක් වූ තොගය සහ දිස්ත්‍රික් ලේකම් කාර්යාල ගබඩාවල හානි වූ බවට හඳුනාගත් පිරිවැය වටිනාකම රු. 565,519 ක් වූ තොගය සම්බන්ධයෙන් මුදල් රෙගුලාසි ප්‍රකාරව ප්‍රධාන ගණන්දීමේ නිලධාරියාගේ අනුමැතිය ලබා ගැනීමට කටයුතු නොකර 2016 වර්ෂයේ වියදමක් වශයෙන් ලියාහැර තිබුණි. |
| (ආ) | 2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛය මගින් ප්‍රකාශිත මුදල් රෙගුලාසි 876(3) | ව්‍යවස්ථාපිත නොවන අරමුදලක් තවදුරටත් පවත්වා ගෙනයාමට සාධාරණ හේතු ඇත්නම් එවැනි අරමුදල් පාර්ලිමේන්තු පනතක් මගින් නීතිගත කිරීමට කටයුතු කලයුතු බව දැක්වෙතත් අරමුදල ව්‍යවස්ථාපිත කිරීමට කටයුතු කර නොතිබුණි. |

### 2.4 ලැබිය යුතු ගිණුම්

ලංකා සළුසල ආයතනයට අයත් ගබඩාවේ ගබඩා කර තිබූ ලිපිද්‍රව්‍ය තොග 2010 වර්ෂයේදී ඉවත් කර ගෙන තිබූ නමුත්, ඒ සඳහා ගෙවූ ගබඩා කුලී තැන්පතුව රු. 1,454,112 ක් ආපසු අයකර ගැනීමට කටයුතු කර නොතිබුණි.

## 3. මූල්‍ය සමාලෝචනය

### 3.1 මූල්‍ය ප්‍රතිඵල

ඉදිරිපත් කරන ලද මූල්‍ය ප්‍රකාශන අනුව සමාලෝචිත වර්ෂයේ දෙසැම්බර් 31 දිනෙන් අවසන් වර්ෂය සඳහා අරමුදලේ මූල්‍ය ප්‍රතිඵලය රු. 23,314,160 ක අතිරික්තයක් වූ අතර, ඊට අනුරූපීව ඉකුත් වර්ෂයේ අතිරික්තය රු. 6,865,974 ක් වූයෙන් ඉකුත් වර්ෂයට සාපේක්ෂව සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රතිඵලයෙහි රු. 16,448,186 ක වර්ධනයක් පෙන්නුම් කෙරුණි. මෙම වර්ධනයට ලිපිද්‍රව්‍ය අලෙවි කිරීමේ ලාභය රු.17,344,017 කින් වැඩිවීම ප්‍රධාන වශයෙන් හේතුවී තිබුණි.

**4.** **මෙහෙයුම් සමාලෝචනය**

**4.1** **කළමනාකරණ ක්‍රියාකාරකම්**

එකතු වටිකානම රු. 53,805,931 ක් වූ ස්ථාවර තැන්පතු කල්පිරීමේ කාලය දින 3 සිට මාස 6 දක්වා වූ කෙටිකාලීන ආයෝජනවල ආයෝජනය කිරීම හේතුවෙන් දිගුකාලීන ආයෝජනය කිරීමෙන් ලබාගත හැකිව තිබූ පොලී ආදායම අහිමි වී තිබුණි.

**5.** **ගිණුම්කටයුතුභාවය සහ යහපාලනය**

**5.1** **මූල්‍ය ප්‍රකාශන ඉදිරිපත් කිරීම**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය ගිණුම් චක්‍රලේඛය සහ 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(2)(ඇ) රෙගුලාසිය ප්‍රකාරව ගිණුම් වර්ෂය අවසන් වී මාස 02 ක් ඇතුළත මූල්‍ය ප්‍රකාශන විගණකාධිපති වෙත ඉදිරිපත් කළ යුතු වුවද, සමාලෝචිත වර්ෂයේ මූල්‍ය ප්‍රකාශන, වර්ෂ 05 ක කාලපමාවකින් පසුව 2021 ජූලි 14 දින ඉදිරිපත් කර තිබුණි.

**5.2** **අයවැය ලේඛනමය පාලනය**

2006 දෙසැම්බර් 22 දිනැති අංක පීඑෆ්/423 දරන රාජ්‍ය මුදල් චක්රලේඛයේ 4.1 ඡේදය හා 2020 අගෝස්තු 28 දිනැති අංක 01/2020 දරන රාජ්‍ය මුදල් චක්‍රලේඛයේ 15 ඡේදයේ ඇතුලත් මුදල් රෙගුලාසි 877(1) රෙගුලාසිය ප්‍රකාරව අරමුදලේ කටයුතු සම්බන්ධයෙන් අයවැය ලේඛනයක් සකස් කර නොතිබුණි.

**6.** **පද්ධති හා පාලනයන්**

විගණනයේදී නිරීක්ෂණය වූ පද්ධති හා පාලන අඩුපාඩු වරින්වර අධ්‍යක්ෂ ජනරාල්වරයාගේ අවධානයට යොමු කරන ලද අතර අභ්‍යන්තර පාලන ක්‍රමවේදයන් ස්ථාපිත කර ගිණුම් පොත්පත් හා වාර්තා ක්‍රමානුකූලව පවත්වා ගැනීම කෙරෙහි විශේෂ අවධානය යොමු කළ යුතුය.